# මධ්‍ය ආසියාවේ චිත්‍ර කලාව

ඉෂාරා මදූෂානි*

මධ්‍ය ආසියානු කලාපය වූ කලී උස් කඳුවැටිවලින් වටවූ මහා කාන්තාරයන්ගෙන් හෙබියා වූ හුදකලා භූමි භාගයකි. විවිධ සාධක පදනම් කොටගෙන මෙහි ජනාවාස බිහිවීමත් බුද්ධාගම පැමිණීමෙන් පසුව දියුණු කලා සංස්කෘතියක් බිහිවීමත් සිදුව තිබේ. මධ්‍ය ආසියානු කලාව තුළ චිත්‍ර කලාවට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. මෙහි දක්නට හැකි සිතුවම් ස්වභාවික ද්‍රව්‍ය උපයෝගී කොටගනිමින් තාත්විකව නිර්මාණය කොට තිබේ. ලෙන්වල දක්නට හැකි සිතුවම් එකින් එකට වෙනස් ස්වරූපයක් ගනු ලබන අතර විවිධ කලා ශෛලීන් අනුව යමින් ඒවා නිර්මාණය කොට තිබේ. මධ්‍ය ආසියානු චිත්‍ර කලාව භූගෝලීය වශයෙන් පවතින සාධක පදනම් කොටගෙන ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. තක්ලමකාන් කාන්තාරයෙන් දකුණු පෙදෙසේ පිහිටි චිත්‍ර හා උතුරු සේද මාර්ගයේ අවට පිහිටි චිත්‍ර වශයෙනි. ඛෝටාන්, බලවස්තේ, දන්ඩන් ඔයිලික්, මිරාන්, තුන්හුවාන්, බාමියාන් ආදී ප්‍රදේශ එහිදී මූලික වේ. මෙම කලාපවල දක්නට හැකි සිතුවම්හි නිර්මාණ ශෛලිය, භාවිත කොට ඇති ක්‍රමෝපායන් හා භාවිත කොටගත් ද්‍රව්‍ය මෙන්ම පුරාවිද්‍යාත්මකව එහි ඇති වටිනාකම පෙන්වාදීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය වේ. අධ්‍යයනය සිදු කිරීමේදී යොදාගත් ක්‍රමවේදය ලෙස පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය භාවිතයට ගනු ලැබේ. මධ්‍ය ආසියානු කලාපය තුළ අතීතයේ දී දියුණු සංස්කෘතියක් පැවති බවට සිතුවම් තුළින් මනාව පිළිබිඹු කරගත හැකිය.

ප්‍රමුඛ පද - සිතුවම්, මධ්‍යාසියාව, තාක්ෂණය, තුන්හුවාන්

* පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, isharamadushani41@gmail.com